# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

**පොදු කාර්යාලය:** 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
**ෆැක්ස්/தொலைநகல்:** 011-2868426

**මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය**
**සරණ මාවත,රාජගිරිය** (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)

***web : www.elections.gov.lk*** ***e-mail : info@elections.gov.lk***


මගේ අංකය : **TR/PE/01/2020** ඔබේ අංකය : දිනය : 2020.07.06
எனது இல. உமது இல. திகதி

වක්‍රලේඛ අංක **PE/2020/TR - 11**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා**
**සියළුම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**
**<u>මැතිවරණ රාජකාරී සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම.</u>**

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී සඳහා තෝරා ගෙන ඇති ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කයට යාමට රාජකාරී දුම්රිය බලපත් ඉල්ලා සිටින්නේ නම් එම ඉල්ලීම් පරිදි ඔවුනට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීමට කරුණාකර පියවර ගන්න. එම බලපත් නිකුත් කිරීම්, ආයතන සංග්‍රහයේ සඳහන් දුම්රිය බලපත් නිකුත් කිරීම හා සම්බන්ධ විධිවිධාන පරිදි සිදුකළ යුතුවේ.

02. බලපත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02.1 දෙපාර්තමේන්තු සංකේත අංකය ලෙස 5422/1 රබර් මුද්‍රාවකින් සටහන් කිරීම වෙනුවට පැහැදිලි ලෙස අතින් ලියන්න.

02.2 රාජකාරියේ ස්වභාවය "2020.08.05 දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී" යනුවෙන් ද සටහන් කරන්න.

02.3 වැය ශීර්ෂය :20-1-1-1409 **(2)**

03. බලපත් නිකුත් කරන ලද නිලධාරියාගේ තනතුර සටහන් කිරීමට ඇති ස්ථානයේ බලපත්‍රය අත්සන් කරන ලද නිලධාරියාගේ නිල මුද්‍රාව තබා ඊට යටින් "මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට" යනුවෙන් අකුරින් ලියන්න.

04. මේ යටතේ නිකුත් කරන සියළුම බලපත්‍ර නිරවුල් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරනු ඇත. එහෙයින් මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන දුම්රිය බලපත් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන විසින් මුදල් ගෙවීමක් සිදු කළයුතු නොවේ.

02 පිටුවට.

05. මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන සියළුම දුම්රිය බලපත් පිළිබඳ විස්තරයක් මේ සමග අමුණා ඇති ආදර්ශ ලිපිය පරිදි සකස් කර ඡන්ද විමසීම නිමවී සති දෙකක් තුළදී මා වෙත ලැබෙන සේ එවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වෙත යැවීමට ද කරුණාකර කටයුතු කරන්න.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත්:

1. විගණකාධිපති
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
3. ප්‍රධාන මූල්‍ය නිලධාරී - ශ්‍රී ලංකා දුම්රිය සේවය.
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී - මැ.කො.ස.
5. ප්‍රධාන ගණකාධිකාරී - මැ.කො.ස.
6. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
7. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
9. ගණකාධිකාරී (ගෙවීම්) - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

**සභාපති**
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல்: 011-2868445
*e-mail :chairman@elections.gov.lk*

**සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)**
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி:011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@elections.gov.lk*

**පරිපාලන නිලධාරී**
நிருவாகஅலுவலர்
දුරකථන/தொலைபேசி: 011-3083371
ෆැක්ස්/தொலைநகல் :011-3083371
*e-mail : info@elections.gov.lk*

මගේ අංකය :
දිනය :

**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**
**<u>මැතිවරණ රාජකාරී සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලයට නිකුත් කළ රාජකාරී දුම්රිය බලපත්</u>**

2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී සඳහා පත්කරනු ලැබූ නිලධාරීන්ට මෙම අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරී දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

02. මෙම බලපත්‍ර සඳහා අදාළ බිල්පත ඔබගේ වැය ශීර්ෂයන්ගෙන් නිරවුල් කිරීම සඳහා පහත විස්තර ඔබ වෙත ඉදිරිපත් කරමි.

.......................................................

ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා

....................................................අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව

| (1) බලපත්‍රය නිකුත් කළ දිනය | (2) නිලධාරියාගේ නම | (3) බලපත්‍ර අංකය | (4) දුම්රිය ස්ථාන | |
|---|---|---|---|---|
| | | | ගමන ආරම්භ කළ දුම්රිය ස්ථානය | ගමන අවසන් කළ දුම්රිය ස්ථානය |
| | | | | |